සිංහල - 7 ශ්‍රේණිය.

අක්ෂර වින්‍යාස රීති.

(1) ගයනි රොද්‍රිගු මිස.

1 * 'න්' 'ණ' අක්ෂර භාවිතය

'ණ' අක්ෂරය මුලට යෙදුණු වචනයකට ඇත්තේ 'ණය' යන වචනය පමණි. උදා - ණය කරයා, ණය ගුළ

* පදයක අවසානයේ 'ණ' යෙදුණහොත් එය හල් වී නොයෙදෙයි.

* පදයක අවසානයේ හල් වී යෙදේ නම් එය දන්තජ 'න්' විය යුතුය.

උදා,- පහන් (පහන) අන්සන් (අත්සන) කන් (කන)

* භාර පදවල 'ර' යන්නට පසුව යෙදෙන්නේ මූර්ධජ "ණ" කාරයයි.

අයිකරණ අසාධාරණ දෙරණ.
ආභරණ පුරාණ
මරණ දරුණු

* 'ර්' අක්ෂරයට පසුව යෙදෙන්නේද මූර්ධජ "ණ" කාරයයි.

අසම්පූර්ණ සංකීර්ණ වර්ණ
කර්ණ ස්වර්ණ පූර්ණ

* රකාරාංශය සහිත අක්ෂරයකට පසුව යෙදෙන්නේද මූර්ධජ 'ණ' කාරයයි.

ආමන්ත්‍රණ ප්‍රණාම ශ්‍රේණිය මුද්‍රණ

* ගැටය සහිත ඇලපිල්ලට පසුව ද මූර්ධජ "ණ" යෙදේ. ඍණ, තෘණ.

* "ර" අක්ෂරයට පසුව යෙදෙන "න" අක්ෂරය හල් අක්ෂරයක්ම වේ.

මිහිරන්, මදුරුන්, සුරන් (දෙවියන්)
හොරන්, රන්, බමරුන්.

* 'ත' 'ථ' 'ද' 'ධ' 'න' යන අකුරකට මුලින් හල් වී යෙදෙන්නේ දන්තජ "න්" අක්ෂරයයි.

ත - ප්‍රාන්ත, දන්ත.
ථ - ග්‍රන්ථ
ද - මකරන්ද
ධ - ආන්ධ
න - බවුන්න

* ක්‍රියා පදවල 'ර' කාරයට පසුව යෙදෙන්නේ දන්තජ 'න' කාරයයි.

කරනවා, දරනවා, ගරනවා.
හදාරනවා, සරනවා, සරසනවා.

* මූර්ධජ 'ෂ' කාරයට පසුව යෙදෙන්නේ මූර්ධජ 'ණ' කාරයයි.

තෘෂ්ණාව පාෂාණ
දූෂණ භීෂණ

* තාලුජ 'ශ' කාරයට පසුව යෙදෙන්නේ දන්තජ 'න' කාරයයි.

දේශන, ප්‍රශ්න, විමර්ශන:
දර්ශන

* දන්තජ "ස" යන්නට පසුව යෙදෙන්නේ දන්තජ 'න' යන්නයි.

අස්සන ලස්සන
වස්සාන වස්සාන

* 'ට' 'ඨ' 'ඩ' 'ඪ' 'ණ' යන අක්ෂරවලට මුලින් මූර්ධජ 'ණ' අකුර යෙදේ
  - ට - ඝණ්ටාර
  - ඨ කණ්ඨජ
  - ඩ අඛණ්ඩ
  - ණ. වණ්ණනා

* ගෞරවාර්ථය හැඟවීමට භාවිතා කරන පදවල මූර්ධජ "ණ" යෙදේ.
  පියාණෝ මෑණියෝ දියණියෝ
  පුතණ්ඩ මලණ්ඩ

* පහත දැක්වෙන වර්ගයේ ක්‍රියා පදවල මූර්ධජ 'ණ' කාරය යෙදේ.
  ලැබිණ. වැටිණ. දැමිණ. ඇඳුණ
  ලැබුණාහ, ඇඳුණි. යෙදුණි.

* "–න්න" යනුවෙන් අවසන් වන එක වචන භාවපද වල යෙදෙන්නේ දන්තජ 'න' කාරයයි.
  ඉන්න. ගින්න දුන්න බලුන්න

## ල , ළ අක්ෂර භාවිතය

* මූර්ධජ "ළ" යන්නෙන් ආරම්භ වන පද.
  ළබැඳි , ළමැද , ළමා , ළිංමෝ ළෙන්ගතු
  ළපටි , ළදරු , ළහිරු , ළපලු . ළග.
  ළඳ ළහැබ, ළිඳ ළැව්

* පදයක අවසානයේ "ළ" කාරය යෙදෙතත් , පද අවසානයේ හල් වී යෙදෙන්නේ දන්තජ "ල" කාරය පමණයි.
  කකුල් . දෑල් . බළල් . රැල් ,
  තොල් විසල් රූල් , තොවිල් , ගෙවල්

පහත සඳහන් වාක්‍ය වචන භේදය / කාල භේදය / පුරුෂ භේදය / ලිංග භේදය යන වාක්‍ය රීති අනුගමනය කරමින් ලියා දක්වන්න.

උදා :- ගුරුතුමිය සිංහල පාඩමක් උගන්වුවාය.
* ප්‍රථම පුරුෂ, ඒක වචන, අතීත කාල, ස්ත්‍රී ලිංග, වාක්‍යයකි.

* ලේනිය කූඩුව සෑදුවාය.

  - - - - - - - - - - - -

* කම්කරුවෝ පාරේ වැඩ කරති.

  - - - - - - - - - - - -

* කුරුල්ලෝ ඈත අහසේ පියඹා ගියෝය

  - - - - - - - - - - - -

* ඔවුහු කිරිබත් හා හකුරු සමග තේ බීවෝය.

  - - - - - - - - - - - -

* වඩුවෝ පුටු සාදති.

  - - - - - - - - - - - -

* සංගීත විශාරදයා ගීතය ගැයුවේය.

  - - - - - - - - - - - -

* අත්තම්මා මල් පුදා බුදුන් වැන්දාය.

  - - - - - - - - - - - -

* මල්ලී කමිසය සෝදයි.

  - - - - - - - - - - - -

* ඔබ පොත කියෙව්වෙහිය.

  - - - - - - - - - - - -

* ගංගා වේගයෙන් පහළට ගලා වැටුණේය.

* පහත සඳහන් පද අනුක්ත රූපයෙන් ලියන්න.

| | | |
|---|---|---|
| මම - | ඔවුහු - | සහෝදරියක් - |
| අපි - | බල්ලා - | කුරුල්ලෝ - |
| තුඹ - | බල්ලෝ - | වෛද්‍යවරු - |
| ඔහු - | ගුරුවරු - | හිරු දෙවියෝ - |
| තෝපි - | ගැහැණියක් - | ගොවියෝ - |
| දළඹරුවෙක් - | දැරියක් - | කාන්තාවක් - |